# 48

# චරිතායන අධ්‍යාපනයේ වටිනාකම සහ ජීවිතය

## ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය විසින් මෙම උපාධි ප්‍රදානෝත්සව දේශනය සඳහා කරන ලද ආරාධනය අනුව ඔබ සැමට කෘතඥතාව පිරිනමමින් අදහස් පළකිරීමට අවසර පතමි.

ජාති, ජරා, ව්‍යාධි, මරණ ආදියෙන් පීඩිත වූ මේ ජීවිතය පවත්වා ගැනීම ඉතා දැඩි වෙහෙසකින් කළ යුත්තකි. මේ ක්‍රියාදාමයේ අපට අයිති කිසිවක් නැත. අප කරන කිසිවක් ද නැත. මේ පීඩාව කැඩිය යුත්තේ හදන තැනින්මය. ලෝකයේ නිමිතිවලට යොමුවීම මේවාට මූලයි. යොමුවීමෙන් අල්ලා ගැනීම ඇතිවේ. ඒ නිසා බාහිර දේට ආසා කොට ඒවා සිතෙන් අල්ලා ගැනීම නතර කළ යුතුය. බන්ධනය කැඩෙන්නේ එමගිනි. ඉතා කෙටි ජීවිත කාලයක් ඇති අප කළ යුත්තේ බාහිර දේට සිතේ බැඳීම ටිකින් ටික අඩුකිරීමය.

ඔබ ඔබට නායකයකු වන කල මේ ආකල්ප ඔබ තුළ තිබිය යුතුය.

1. නායකයා විසින් ඉටුකර ගැනීමට උත්සාහ කරනු ලබන පරමාර්ථය ධර්මානුකූල විය යුතුය.
2. මිනිසා පිළිබඳ යහපත් ආකල්පයක් ජනිත කරගත යුතුය.

අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයට අනුව ඔබට දුක් පිණිස ද, අනුන්ට දුක් පිණිස ද, ඔබටත් අනුන්ටත් දුක් පිණිස ද වේ නම් එය අකුසලයකි. එය නොකළ යුතුය. එසේම ඔබට සතුට හා සුව පිණිස ද අනුන්ට සතුට හා සුව පිණිස ද වේ නම් එය කුසලයකි. එය කළයුතුය.

ශක්තීන් අතර චරිත ශක්තිය ප්‍රධාන වන්නේය. කාය ඥාන ශක්තීන් ඇතත් යමකුට චරිත ශක්තිය නැතිනම් ඔහු ඔහුටම සතුරෙකි. ඔහුගෙන් රටටත් මහත් විපතක්ම සිදුවන්නේය. පසුගියදා මෙරට පැමිණ හිටපු ඉන්දීය ජනාධිපති ආචාර්ය අබ්දුල් කලාම් තම රටේදී මෙන්ම අප රටේදී ද පැවසූ අදහසක් ඔබ වෙත ගෙනහැර පාමි. ඔබ හට තම රටෙන් කුමක් කළේදැයි නොඅසන්න. ඔබ විසින් තම රටට කුමක් කරන්නේදැයි විමසන්න.

රටතොටදී අපට මුණගැසෙන බොහෝ දෙන රුදුරු ආත්මාර්ථකාමී මිනිස්සු වෙති. ස්වාර්ථ සාධනය ස්වාභාවික ප්‍රපංචයකි. එම ස්වාර්ථය පිණිස වැඩකිරීම අන්‍යයන්ගේ අයහපතට හේතු නොවීම වැදගත් ය. අංගුත්තර නිකායේ බුදුන් වහන්සේ කළ දේශනයක අඩංගු සංකල්ප දෙකක් මෙසේය. වඩාත් ශ්‍රේෂ්ඨ හා ප්‍රණීතකාර වන්නේ අත්තහිත පරහිත පුද්ගලයාය. තමන්ගේ දියුණුව පිණිසත් අනුන්ගේ අභිවර්ධනය උදෙසාත් ක්‍රියා කරන්නාය.

සිත් ගන්නා මිනිසුන් නම් හැමදේටම උනන්දුවක් දක්වන අයයි. කාරියක් සංසිද්ධ කරගන්නා, කටයුත්තක් නිමාවට පත්කර ගන්නා මිනිස්සු නම්, නියමිත කාලසීමාවක් තුළ එක් දේකට පමණක් උනන්දුවක් දක්වන්නෝය. කායික ආශාව ජීවිත පරමාර්ථය ආක්‍රමණය කළහොත් එවිට මිනිසා මිනිස්කමින් බැහැර වේ. මිනිසුන්ගේ මුඛ්‍ය පරමාර්ථයක් නම් සතුට ළඟාකර ගැනීමට කරන

උත්සාහයයි. ඒ සඳහා හොඳින් හෝ නරකින් වැඩ කිරීමයි. බෞද්ධ භාවනාවේදී යොදා ගැනෙන ඉතා ගැඹුරු තේරුමකින් විස්තර කැරෙන මේ කරුණ දෙස සිත් යොමුකළ මැනව, ප්‍රීතිය යනු තමන්ට අවශ්‍ය දෙය ලබා ගැනීම නිසා ඇති වූ තෘප්තිමත් බවයි. සුඛය යනු ලබාගැනීමෙන් පසු එය සත්‍ය ලෙසම අත්විඳීමයි. මෙය විශුද්ධි මාර්ගයෙහි විස්තර කරනුයේ මෙසේය.

කාන්තාරයක විඩාපත්ව සිටින මගියකු හට වන රොදක් අසල ඇති පොකුණක් දකින්නට ලැබෙයි. ඔහුට ඇතිවන හැඟීම ප්‍රීතියයි. ඔහු එම වන රොදෙහි සෙවණට ගොස් පොකුණින් දිය බොයි. ඔහු ලබන්නේ සුඛයයි.

අපගේ මනස සාරභූමියක් වැනිය. එහි ඕනෑම ගසක් සරුවට වැවේ. එනිසා අප අපගේ මනස තුළ හොඳ අරමුණු හොඳ සිතුවිලි වගාකර ගතයුතුය. බීජය පැළකළ පසු එහි වැඩීම නිරායාසයෙන් සිදුවේ. ස්ථිර ප්‍රධාන අරමුණක් මනස තුළට ඇතුළු කළ විට එහි වැඩීම සොබාදහම වෙත භාරවේ.

තමා ගැන සෙවිල්ලෙන් සිටින්න. සිත හොඳින් රැකගන්න. අත්තානං ගවෙසෙය්‍යාථ සචිත්ත මනුරක්ඛථ, වරදවා පිහිටුවන ලද සිත් ඇත්තෝයැ, මනාකොට පිහිටුවන ලද සිත් ඇත්තෝයැ යි මිනිස්සු දෙකොටසකට බෙදෙති.

එසේම ශූරයෝ - වීරයෝ - ධීරයෝ ලෙසින් මිනිස්සු තුන් කොටසකට බෙදෙති. ශූරයෝ නම් යම් යම් කාර්යයන්හි දක්ෂයෝය. හුරුවූවෝය. වීරයෝ නම් බාධා නොබලා පටන් ගත් කාර්යය මුදුන්පත්වන තුරුම කරන්නෝය. බුහුටියෝය. ධීරයෝ නම් සැපත් විපත් ආදී ලෝ දහම්හි නොසැලෙන නොකැළඹෙන නොපෙරළෙන දිරි ඇත්තෝය. මේ ගුණ තුන ඇති අය උතුම්ය. ඉනුත් ධීර ගුණය ඇත්තාම උතුම්ය.

1960 දශකයේ ලොව දිළිඳුම රටක් වූ ටැන්සානියාවේ දියුණුව ඇතිකර ලීමට ජුලියස් නියරෙරේ මහත් උත්සාහයක් ගත්තේය. ඔහු විශිෂ්ට අධ්‍යාපනඥයෙකි. 1967 දී එරටට හඳුන්වා දුන් අරුෂා ප්‍රකාශනය අනුව මානව සංවර්ධනය ස්වශක්තිය පිළිබඳ ආකල්පය, එරට සෞඛ්‍යය, අධ්‍යාපනය සහ දේශපාලන අනන්‍යතාව සහ ක්ෂේත්‍රයන්හි කැපී පෙනෙන අධ්‍යාපන දර්ශනය ප්‍රධාන තේමා දෙකක් ඔස්සේ සලකා බැලීම වටී. එනම්,

1. ස්වශක්තිය සඳහා අධ්‍යාපනය සහ වැඩිහිටි අධ්‍යාපනය
2. යාවජීව අධ්‍යාපනය සහ විමුක්තිය සඳහා අධ්‍යාපනය යනු විසිනි.

ආත්ම විශ්වාසය සඳහා අධ්‍යාපනය අවශ්‍යය. අධ්‍යාපනය පොදු යහපත සඳහා ක්‍රියාත්මක විය යුතුය. සමූපකාරී බව වර්ධනය කළ යුතුය. සාමානාත්මතාව ධෛර්යවත් කළ යුතුය. ඒ නියරෙරේගේ අදහස් ය. ඉන්දියාවේ පුට්ටපර්තී ගමේ උපන් ජන සමාජයක් වෙනස්කළ ශ්‍රී සත්‍යසායි තුමා පවසනුයේ අධ්‍යාපනයේ කෙළවර චරිත සංවර්ධනය විය යුතු බවයි.

මිනිසුන් වර්ග සතරකි. ඒ මෙසේය.

1. කතා කරති. වැඩ නොකරති.
2. කතා නොකරති. වැඩ කරති.
3. කතා නොකරති. වැඩ නොකරති.
4. කතා කරති. වැඩ කරති ඔබ අයත් වන්නේ මින් කුමන කොටසටද?

මනුෂ්‍ය ජීවිතයේ අභිවර්ධනය පිණිස එක් පසෙකින් ක්‍රීඩාව ද අනික් අතින් සෞන්දර්ය කලා විෂයයන්ද අවශ්‍ය වේ යයි සොක්‍රටීස් පඬිවරයා පැවසීය. ඇරිස්ටෝටල්, ප්ලේටෝ ගේ දේශන ලේඛන සංහිතා කියවන්නේ නම් සාහිත්‍ය සෞන්දර්ය කලාවන්ගේ ප්‍රයෝජනය කවරේදැයි වටහාගත හැකිය. චිත්‍ර, මූර්ති, සංගීත, නර්තන, සාහිත්‍යය මිනිසා සංවේදී පුද්ගලයකු බවට පත් කරන්නේය. ජපන් රටේ මුල් ළමාවිය සංවර්ධන පාසල්වල ළමයින්ට ගුණධර්ම වර්ධනය කිරීමේදී ඉසියුම් රසවත්, හරවත් කතන්දර, කවි, ගීත උපයෝගී කරගනු ලැබේ. ලෝකයේ බොහෝ රටවල භාවිතයද එසේ වන්නේය. කාව්‍ය යන වචනය අපට පුරුදුය. කාව්‍යය යන්න ගද්‍ය, පද්‍ය චම්පූ/ මිශ්‍ර යනුවෙන් කොටස් තුනකට බෙදා ඇත.

කිසියම් ප්‍රබල වින්දනයක් අන්තර්ගතවන හෝ සම්ප්‍රේෂණය කෙරෙන ගද්‍යයෙන් වේවා පද්‍යයෙන් වේවා ගද්‍ය පද්‍ය මිශ්‍රණයෙන් වේවා රචිත කෘතිය කාව්‍යයක් සේ සලකනු ලැබේ. කාව්‍යය යන්න අද දින අප විසින් භාවිත කරන සාහිත්‍යයටද පර්යාය ලෙස උපයෝගී කොටගත හැකිය. රස සහ අර්ථ සහිත බව සාහිත්‍යය ලෙස පොත පතෙහි දක්වේ. ජේම්ස් මොනැකෝ නම් විචාරකයා විසින් ලියන ලද 'හව් ටු රීඩර් අ ෆිල්ම්' යන කෘතියෙහි කලාව යන පරිච්ඡේදයෙහි ප්‍රාසංගික කලා, නියෝජනාත්මක කලා, වාර්තික කලා තුන් ආකාරයේ බෙදීමක් දක්වයි. භරතමුනි නාට්‍යශාස්ත්‍රය ඉන්දියාවේ බිහිවූ කලාව, සෞන්දර්යය, රසාස්වාදනය, නාට්‍ය, සංගීත වැනි කලාංග ලක්ෂණ විස්තර කැරෙන ප්‍රමුඛ ග්‍රන්ථයකි. මේ කෘතියේ සිංහල පරිවර්තන කීපයකි. කොටස් වශයෙන්ද සම්පූර්ණයෙන්ද සිංහලයට නඟා ඇත. මහාචාර්ය හේමපාල විජයවර්ධන, මහාචාර්ය සුචරිත ගම්ලත්, මහාචාර්ය වෝල්ටර් මාරසිංහ, ආචාර්ය හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි බඳු ගිහි පැවිදි පඬිවරු මේ කාර්යය ඉෂ්ට කළහ. මහාචාර්ය ඒ.වී. සුරවීර විසින් පරිවර්තනය කරන ලද ලියෝ තොල්ස්තෝයි ගේ' කලාව යනු කුමක්ද? සහ ඇරිස්ටෝටල් කාව්‍ය ශාස්ත්‍ර මේ ක්ෂේත්‍රයන්හි මූලික අනගි පොත් වන්නේය. ඉන්පසුව දහස් ගණන් ලේඛන කලාව, සෞන්දර්යය, රසවින්දනය අරබයා ලියැවී තිබේ. සිංහල බසින් පමණක් කියවන පාඨකයන්ට ද සෑහෙන සංඛ්‍යාවක් රචනා, කෘති කියවීමට අවස්ථාව උදාවී තිබේ.

'යහපත් කාව්‍යයෙහි තථ්‍ය ස්වරූපය මුහුකුරා ගිය නුවණැත්තන්ගේ සිත් තුළ පවා බොහෝ කාලයක් තිස්සේ නිදාගෙන මෙන් පැවතුණි. ඒ කාව්‍ය විෂයන් සහෘදයන්ගේ අභිවෘද්ධිය තකාය.' ආනන්දවර්ධන නම් විචාරකයා පැවසීය.

පෙර අපර දෙදිගම සාහිත්‍ය අභිවර්ධනයේ අන්තර්ගාමී නියාමය වී තිබෙන්නේ මිනිසා තුළ කලින් කල හටගන්නා වූ සෞන්දර්ය පිළිබඳ සංකල්ප සන්තතියයි. සාහිත්‍යයේ මතු නොව, මානව සමාජයේ පැවැත්මද රඳා පවත්නේ සෞන්දර්යයේ ඖෂධීය බලයෙනි. පෙරදිග මීට කීවේ 'කලාව' කියාය. කුමන සමාජයක පැතිර ගියත් රසාස්වාදයක් කලාවත්, සෞන්දර්යයත් පාදක කොට ඇතිවී තිබේ.

කලා කෘතියක අගය සම්පූර්ණයෙන්ම රඳා පවතින්නේ එය කියවන හෝ බලන පුද්ගලයාගේ බුද්ධිය උඩ බව කියයි. එය රස විඳගන්නා තැනැත්තා සහෘදයා නමින් හැඳින්වේ.

ප්‍රතිභා ව්‍යුත්පත්ති සතතාභ්‍යාස යන සංකල්ප තුන පෙරදිග විචාර කලාවේ නිබඳව කියැවෙන්නකි. අපූර්ව වස්තු නිර්මාණක්ෂමා ප්‍රඥා ප්‍රතිභා යනු පෙර නොවූ විරූ නිර්මාණ කරලීමේ ප්‍රඥා ශක්තිය ප්‍රතිභාව නමින් හැඳින්වේ. එම කුශලතාව පොත පත කියැවීමෙන් වර්ධනය කරගත යුතුයි. නිරන්තර අභ්‍යාසයේ යෙදීම ද ඵලදායි නිර්මාණකරණයේ මෙන්ම රසවින්දනයේ ද මඟකි.

මිනිසා බාහිර ලෝකය හා ස්වභාවධර්මය සමඟ ඒකාබද්ධ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මිනිසා සිය අවබෝධය පුළුල් කරගන්නා අතර තමා ගැන ම මනා අවබෝධයක් ලබා ගනියි. මේ ක්‍රියාව වූ කලී ස්වභාව ධර්මයේ නීතියක් වශයෙන් ගත හැකි ප්‍රේමයයි. අනෙක් කාර්යය නම් ප්‍රේමය අනෙක් අය හා සම්බන්ධ කිරීමයයි, රවීන්ද්‍රනාත් තාගෝර් සඳහන් කරයි. භාරතීය සෞන්දර්යවේදීන් මෙය හැඳින්වූයේ 'බ්‍රහ්මාස්වාද සහෝදරත්වය' යනුවෙනි. කලාකෘති විග්‍රහ කළ ආනන්ද කුමාරස්වාමි මීට මානව සහෝදරත්වය යනුවෙන් පැවසීය.

පරිකල්පනය - සාහිත්‍ය කලානිර්මාණ කිරීමේදී සාහිත්‍යයෙන් යම් ප්‍රමාණයක් හා සිතින් මවාගත් දෑ මඟිනුත් යම් ප්‍රමාණයක් සංයෝග කිරීම කලාකරුවන්ගේ කාර්යයයි. නිර්මාණයක් කෙරෙනුයේ ප්‍රධාන වශයෙන් මේ දෙකෙහි සංකලනයෙනි. ලොව කිසිදාක කොතැනකවත් නොවූ නොතිබූ නොඇසූ අමුතු දෑ නොහොත් අත්භූත දෑ පමණක් පරිකල්පනයට විෂය වන බව සිතීම සත්‍යයෙන් තොරය. තමන් ඇසූ දුටු සත්‍ය වුව වෙනස් ආකාරයකින් ඉදිරිපත් කිරීම පරිකල්පනයට අයත් වේ. කල්පිතයටද සත්‍යය පසුබිම වන බව කියනු ලබනුයේ එහෙයිනි. පරිකල්පනය සඳහා ප්‍රතිභාව/ ප්‍රතිභා ශක්තිය අවශ්‍ය වේ. පරිකල්පනය විවරණය කිරීමේදී ෂේක්ස්පියර් මහා ලේඛකයාගේ කාව්‍යයක් උපුටා දැක්වීමට බොහෝ විචාරකයෝ අමතක නොකරති. එහි සිංහල අනුවාදය මෙසේය.

බැලුම් හෙලයි කවියා, සියුම් උමතුවකින්
බමවමින් නෙත්, පොළෝ සුරලෝ අතර ඔබ මොබ
පරිකල්පන බෙලෙන්,
පෙර නොවූ විරූ සියලු දෑ
කවි තෙලිතුඩට හසු වී
හැඩ වැඩ ලබා ඔප වී
මෙලොව ඇස් පනාපිට
නම් ගොත් ද ලැබගෙන
අප අබියසට පැමිණෙයි
පටු මාවතක අල්ප දර්ශනයෙන්,

කවියා සකල ලෝක ධාතුවම දකියි - රවීන්ද්‍රනාත් තාගෝර් කවියා පළකරන අදහසකි.

මිනිසාට අවශ්‍ය වන්නේ කුමක්ද? දියුණු වීමද? සතුටක් ලැබීමද? සිතට සතුටක් නොලැබේ නම් දියුණු වී කුමක් කරන්නද? ජීවිතයේ දියුණුවක් ලැබුවත් තමාගේ සතුට නැති කරගත් බොහෝ දෙනා ගැන මම දනිමි.

රසවිඳීමේ ශක්තිය ගෙවී ගොස් මොට වී ඇති නිසා ඔවුන්ට ජීවිතයේ නියම සතුටක් නොලැබේ. ඔවුන්ට ජීවිතය යනු ඒකකාරී වූද එකම වර්ණයෙන් යුක්ත වූද අර්ථහීන එකකි. ඔවුන්ගේ මොට වූ හදවත්වල රසවිඳීමේ ශක්තිය නැත. චින්තා ලක්ෂ්මි සිංහාරච්චි පරිවර්තනය කළ විභූති භූෂණ බන්ධෝපාධ්‍යාය ලියූ අරණකට පෙම්බැඳ, නවකතාවේ සඳහන් කරුණකි.

දවසින් බොහෝ වේලාවක් ආර්ථික නිෂ්පාදන උදෙසා කායික ශ්‍රමය වැයකිරීමේ අවශ්‍යතාවන්ගෙන් විමුක්ත වන මහජනතාව එම කාලය උපයෝගී කරගනුයේ කුමක් සඳහාද? පන්ති සමාජීය ඉතිහාසය මුළුල්ලේ තමන්ට අහිමි කර පැවති සංස්කෘතිය අත්පත් කරගැනීමටය.

එම සංස්කෘතිය වර්ධනය කරනු වස් තම ගත, සිත යෙදීමටය. මහාචාර්ය පියසීලි විජේගුණසිංහ මාක්ස්වාදී කලා විචාරය සහ මූලධර්ම ග්‍රන්ථයේ කරුණු ගෙනහැර පාන්නීය.

අසමත් වූ ළමයි දූන් කුඹුරු වැඩෙහි යෙදී සිටිති. අප දූන් අනුභව කරන සෑම ආහාරවේලකම නූගත් ඔවුන්ගේ ඩහදිය බිඳුවක් ද ඇත.

ඉතාලියේ බාර්සියානා පාසලේ ළමයින් ගුරුතුමියට යැවූ ලියුමක එසේ සඳහන් වේ. ඉවසීම පුරුදු කළයුතු යයි බුදුන්වහන්සේ දේශනා කළහ. සීතල, උණුසුම, බඩගින්න, පිපාසය, මැසි මදුරුවන්, කෘමීන්, සර්පයන්, නින්දා අපහාස, මාරාන්තික කායික වේදනා, ඉවසීමෙන් ධෛර්යයෙන් අධිෂ්ඨානයෙන් මේ ජීවන ගමන යා යුතුය. එය දිනාගත යුතුය. එහිදී අපේක්ෂාව ඇතිකර ගන්න.

මම මගේ හදවත වෛරය හා ඊර්ෂ්‍යාවෙන් තොර කිරීමට ද සෑම කෙනෙකු සමඟම එකමුතුකමින් ජීවත් වීමට ද වැර දරමි. ජීවිතයේ සරු යහපත් මෙන්ම නිසරු අයහපත් කාලයන්හිදී බුදුදහමට සමීපව දැහැමින් දිවි ගෙවමි. මෙම ලෝකය අතහැර යාමට සිදු වූ අවස්ථාවකදී බියෙන් හෝ කණගාටුවෙන් තොරව සමු ගන්නෙමි. එසේ වන්නේ මෙහි පැමිණියාට වඩා යහපත් කෙනෙකු වශයෙන් පිටවන නිසාය.

ඔබ කවර වර්ගයකට, ආගමකට, අයත් වුවද මේ අදහස පොදුවේ අප කාටත් උරුමය. ඔබට ජයෙන් ජය, ජයහපත සුවසෙත උදාවේවා.

*2015.07.13*